# නිර්මාණාත්මක ජන සන්නිවේදන ලක්ෂණ සහිත සාර්වත්‍රික ජන මාධ්‍යක් වශයෙන් අභිලේඛනයන්හි පවත්නා උපයෝගිතාව

ඒ. අනෝමදස්සි හිමි[1]

සියවස් ගණනක් වූ පැරණි ලාංකේය සමාජය තුළ පැවති ප්‍රමුඛ සන්නිවේදන ක්‍රියාවලියක් වශයෙන් සෙල්ලිපිකරණය පෙන්වාදිය හැකිය. නිතරම ජනාකීර්ණ වූ ස්ථානවල පිහිටුවා ඇති සෙල්ලිපි ප්‍රධාන වශයෙන් ලෙන්ලිපි, ගිරිලිපි, ටැම්ලිපි, පුවරුලිපි ආදි වශයෙන් වර්ග කිරීමක් ද දක්නට ලැබේ. සෙල්ලිපිකරණයේ මුල් අවධියේ දක්නට ලැබෙනුයේ සංක්ෂිප්ත පෞද්ගලික යමක් දැක්වීම සඳහා සෙල්ලිපි යොදාගත් ආකාරයකි. පසුකාලීනව එහි සංවර්ධනීය තත්ත්වයන් පෙන්නුම් කරන අභිලේඛන ප්‍රධාන රාජ්‍ය මාධ්‍ය වූවා සේම ඒවා නිර්මාණාත්මකව සකස් කළ අයුරු ද දක්නට ලැබේ. පුරාණ සමාජයේ අභිලේඛන පොදු ජන මාධ්‍යක් බවට පත්වීමට තුඩුදුන් ප්‍රධාන කාරණාව නම් ඒවා පන්ති බේදයකින් තොරව සියල්ලන්ටම පරිශීලනය කිරීමට හැකිවීමය. අභිලේඛනයන්හි භාවිත සංකේතාර්ථ නිසාවෙන් සාක්ෂරතාවෙන් හීනවූවන්ට වුව සන්නිවේදන අවශ්‍යතාව සපුරා ගැනීමට දෘශ්‍ය සාක්ෂරතාවයෙන් හැකිය. මෙහිලා උපයුක්ත සෑම සංකේතයකම ව්‍යංග්‍යාර්ථයක් පවතින අතර ඒ සියළු සංකේත ජන සංස්කෘතියෙන්ම උපුටා ගත් ඒවාය. නිදර්ශනයක් වශයෙන් චෛත්‍ය, නෙළුම, සිරිපතුළ වැනි සංකේත යොදාගත්තේ ශාසනික කටයුත්තක් සඳහාය. 'ඩෙනිස් මැක්වේල්' සන්නිවේදනයේ බලය ක්‍රියාත්මක වීමට හේතුවන තොරතුරු සැපයීම, පෙළඹවීම ආදි වශයෙන් පංචවිධ ක්‍රියාකාරිත්වයක් පෙන්වාදෙන අතර අභිලේඛනයන්හි සන්නිවේදන ක්‍රමෝපායන් මතද තත් කාරණා අන්තර්ගතව ඇතිබව පැහැදිළිය. මිහින්තලා පුවරු ලිපිද්වය, ජේතවන සංස්කෘත ලිපිය ආදිය ව්‍යවස්ථා, අණපණත් ලක්ෂණ සහිත රාජ අණින් ප්‍රකාශිත සෙල්ලිපිය. සෑමවිටම පාලන තන්ත්‍රයට වාසිදායක ලෙස අභිලේඛන සමාජගත කළ අතර පැරණි සන්නිවේදකයා භාෂාව හා ආකෘතිය නිර්මාණාත්මක ලෙස එහි භාවිත කර ඇති බව ද එතුළින් පෙනේ. කුසලාන්කන්ද, තොපා වැව වාන් ඇළ ආදි ලිපි නිර්මාණාත්මක භාෂා ලක්ෂණ පෙන්වන අතර කොස්ගමකන්ද, කරඳහෙල ආදි ලිපි ගීතාත්මක භාෂා ලක්ෂණ පෙන්වයි. නිශ්ශංකමල්ල රජුගේ ලිපි තුළින් සාර්ථක ප්‍රචාරක ලක්ෂණ මෙන්ම උපමාදිය යොදාගනිමින් සිය පාලන ක්‍රමවේදය නිර්මාණාත්මකව දක්වන අයුරුද පෙනේ.

ප්‍රමුඛ පද : අභිලේඛන, නිර්මාණාත්මක සන්නිවේදනය, සංකේතාර්ථ, භාෂා ලක්ෂණ

[1] භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. anomadassi156@gmail.com